**<u>දිවුලපිටිය ප්‍රාදේශීය සභාව</u>**

**<u>ගම්පහ දිස්ත්‍රික්කය</u>**

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 26 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **<u>තත්ත්වාගණනය කළ මතය</u>**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**.

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කාර්යාල මේස 03 ක වටිනාකම රු.46,912 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) ඉඩම් හා ගොඩනැගිලි 29 ක වටිනාකම තක්සේරුකර ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) ගිණුම අනුව පොදු ගබඩා තොගය රු.23,219,605 ක් වුවද 2017 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද තොග සත්‍යාපනයට අනුව තොගයේ වටිනාකම රු.119,765 ක් විය. මෙම වෙනස ගිණුම්වලට ගලපා නොතිබුණි.

(ඈ) ආදාහනාගාරයට ගෑස් මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.415,520 ක් වැයකර තිබූ නමුත් ගිණුම්ගත කර තිබුණේ රු.271,780 ක් බැවින් රු. 143,740 ක වියදම් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 **<u>නොසැසඳු ගිණුම්</u>**

අත්තිකාරම් ගිණුම් විෂයන් 06 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපයෝගී ලේඛන අනුව ශේෂය අතර රු.5,317,431 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 **<u>ලැබියයුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

(අ) <u>ලැබිය යුතු ගිණුම්</u>

(i) 2018 මැයි 04 දින වන විටත් නිරවුල් නොකල අත්තිකාරම් ශේෂය රු.7,618,369 ක් වූ අතර එහි අවු. 1 සිට අවුරුදු 3 දක්වා රු.10,000 ක්, අවු.3 සිට අවු.5 දක්වා රු.124,433 ක් සහ අවු.5 ට වැඩි රු.7,483,936 ක් විය.

(ii) 2017 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව ආදායම් ණයගැතියන්ගේ ශේෂයේ වර්ෂ 01 ත් 03 ත් අතර රු.66,406,583 ක්, වර්ෂ 03 ත් 05 ත් අතර රු.2,987,630 ක් හා වර්ෂ 05 ට වැඩි රු.34,243,995 ක් විය.

(ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u>

(i) 2017 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව ණයහිමි ශේෂයේ වර්ෂ 1 සිට වර්ෂ 3 දක්වා රු.85,281,255 ක් හා වර්ෂ 3 ට වැඩි රු.103,099,467 ක් විය.

(ii) 2017 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ රු.15,318,744 ක ශේෂයක් තිබුණු අතර ඉන් රු.11,354,596 ක් වර්ෂ 02 කට වැඩි කාලයකට අදාල විය.

1.3.4 **<u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම</u>**
**<u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.</u>**

(අ) අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.2,818,931 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) නව කාර්යාල ගොඩනැගිල්ල සඳහා මිලදී ගෙන තිබූ රු.3,457,350 ක කාර්යාල උපකරණවල මිල, ප්‍රමාණය හා වටිනාකම්වල නිවැරදිතාවය පරීක්ෂා කිරීම සඳහා ඉන්වොයිස් පත්‍රයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.3.5 **<u>නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>**
නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | ---------------------------- | ----------- | -------------------- |
| | | රු. | |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 19 | - | සියළුම උප පත්‍රිකා සහිත පොත් සභාවේ ලේකම්වරයා භාරයේ පැවතිය යුතු අතර, ඒවායේ සුරක්ෂිතභාවය හා නිසි භාවිතය පිළිබඳ ලේකම්වරයා පෞද්ගලිකව වගකිවයුතු වුවත් සභාවේ උප පත්‍රිකා පොත් ගබඩා නිලධාරී භාරයේ පැවතුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) | මුදල් රෙගුලාසි 371 | 39,127 | වර්ෂ 03 ට වැඩි අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | 11,354,596 | අවු.02 ට වැඩි පොදු තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.30,618,984 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට ඉක්ම වූ ආදායම රු. 25,990,232 ක් විය.

### 2.2 <u>මූල්‍ය පාලනය</u>

2017 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරනලද බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව නිකුත්කර මාස 06 ක් ඉක්මවන ලද රු.28,556 ක් වූ චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.3 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.3.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම් රැස්කල ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම් ,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත පරිදි විය.

| | ආදායම් ප්‍රභවය | 2017 වර්ෂය ඇස්තමේන්තුගත ආදායම | 2017 වර්ෂය බිල්කළ ආදායම | 2017 වර්ෂය රැස්කළ ආදායම | 2017 වර්ෂය දෙසැම්බර් 31 දිනට මුළු හිගය | 2016 වර්ෂය ඇස්තමේන්තුගත ආදායම | 2016 වර්ෂය බිල්කළ ආදායම | 2016 වර්ෂය රැස්කළ ආදායම | 2016 වර්ෂය දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 11,812,000 | 13,070,056 | 11,724,881 | 1,345,175 | 11,190,500 | 11,805,691 | 9,408,225 | 2,397,465 |
| (ii) | කුලී | 5,694,000 | 6,023,013 | 2,911,489 | 3,111,524 | 7,705,000 | 6,673,185 | 3,278,058 | 3.395,126 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,100,000 | 1,949,108 | 1,916,438 | 32,670 | 775,000 | 1,114,370 | 1,081,700 | 32,670 |
| (iv) | වෙනත් ආදායම් | 6,879,000 | 10,332,870 | 10,332,870 | - | 6,318.000 | 7,906,199 | 7,906,199 | - |
| | | 25,485,000 | 31,375,048 | 26,885,679 | 4,489,369 | 25,988,500 | 27,499,447 | 21,674,184 | 5,825,262 |

#### 2.3.2 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

2017 වර්ෂයේ බිල්කල ආදායමින් 98% කට ආසන්න ප්‍රමාණයක් වර්ෂය තුල රැස්කර ගෙන තිබූ නමුත් පෙර වර්ෂයන්හි හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය අවම මට්ටමක පැවතුණි. විස්තර පහත පරිදි වේ.

| ආදායම් ප්‍රභවය | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිගය | 2017 වර්ෂයේ හිගය | පෙර වර්ෂවල හිගය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,101,394 | 343,789 | 757,605 |
| කුලී | 3,111,523 | 42,738 | 3,068,785 |
| එකතුව | 4,212,917 | 386,527 | 3,826,390 |

2.3.3 **වරිපනම් හා බදු**

2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.871,878 ක වරිපනම් හිඟ ශේෂය තුල අවු. 5 – 10 අතර රු.160,654 ක සහ අවු. 10 ට වැඩි රු.270,600 ක හිඟ ශේෂ පැවති අතර එම හිඟයන් අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුනි.

2.3.4 **කුලී**

(අ) **බදු කුලී**

වර්ෂ 10 කට පෙර සිට පැවති බදුකුලී හිඟ ශේෂය රු.2,803,705 ක් වූ අතර මින් රු.1,718,012 ක ශේෂයක් කෙහෙල්ඇල්ල උප කාර්යාලයට අදාල මස්කඩ හා මාළු කඩ වෙනුවෙන් වැරදි බිල් කිරීමක් විය. මෙම හිඟ ශේෂය කපා හැරීමට 2017 ඔක්තෝබර් 06 දින පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා තිබුණ ද මෙතෙක් අනුමැතිය ලබාදී නොතිබුණි. තවද දිවුලපිටිය උප කාර්යාලයෙන් බිල් කරන ලද රු.674,594 ක ශේෂය තුල 1999 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාල පරාසයකට අදාල හිඟ ශේෂ පැවතුණි.

(ආ) **කඩකුලී**

(i) දිවුලපිටිය උපකාර්යාලයේ රු.176,697 ක් වූ මුළු හිඟ කඩකුලී ශේෂයෙන් 1999 වර්ෂයේ සිට 2006 දක්වා කාල පරාසයකට අයත් කඩකාමර 07 කට අදාලව රු.90,554 ක හිඟ ශේෂයක් විය. මෙම කඩකාමර මේ වන විට කඩා ඉවත්කර ඇති අතර මෙම ශේෂ කපාහැරීම සඳහා 2017 ඔක්තෝබර් 06 දින පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යවා තිබුණි.

(ii) තුරු සෙවන කඩ 14 කට අදාල රු. 86,143 ක් 2008 වර්ෂයේ සිට පැවත එන හිඟ ශේෂයක් වූ අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවරා දී තිබූ දේපළකට මෙය අදාල විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණ කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 09 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් 09 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් 2017 වර්ෂයේදී කොම්පෝස්ට් අංගනය සඳහා පුනරාවර්තන වියදම් ලෙස රු.4,066,667 ක් සහ ප්‍රාග්ධන වියදම් ලෙස රු.6,933,319 ක් වැයකර තිබුණි. වර්ෂය තුල කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 44,118 ක් නිෂ්පාදනය කර තිබූ අතර උපයාගෙන තිබූ මුළු ආදායම රු.527,262 ක් විය.

(ඇ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය පිළිබඳව ප්‍රාදේශීය සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුලින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 ජූනි 19 දින වන විටත් සකස්කර නොතිබුණි.

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ) <u>ගබඩා ලේඛන</u>

ගබඩා භාණ්ඩ ලැබීමේදී හා නිකුත්කිරීමේදී තොග පොත් වල නියමිත පරිදි සටහන් යොදා නොතිබුණි.

(ආ) <u>ආදාහනාගාර ගෑස් වියදම</u>

2017 වර්ෂය තුලදී මරඳගහමුල ආදාහනාගාරය මෘත දේහයන් 275 ක් ආදාහනය කිරීම සඳහා ගෑස් සිලින්ඩර 45 ක් වැයකර තිබූ අතර කොටදෙනියාව ආදාහනාගාරය මෘත දේහයන් 104 ක් ආදාහනය කිරීම සඳහා ගෑස් සිලින්ඩර 60 ක් වැය කර තිබුණි. මෙම අසාමාන්‍ය වෙනස කළමනාකරණය විසින් අධීක්ෂණය කර අවශ්‍ය පරිදි කටයුතු කර නොතිබුණි.

3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

(අ) <u>සේවක පුරප්පාඩු හා අතිරික්ත</u>

| ශ්‍රේණිය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| මාණ්ඩලික | 03 | 03 | - | - |
| ද්විතියික | 40 | 34 | 06 | - |
| ප්‍රාථමික | 160 | 162 | 07 | 09 |
| | ------ | ----- | ---- | ------ |
| | 203 | 199 | 13 | 09 |
| | === | === | === | === |

2017 වර්ෂයේ සිට වැඩ ක්ෂේත්‍ර පරිපාලක තනතුරක් , කළමනාකරණ සහකාර තනතුරු 02 ක් සහ ආදායම් පරීක්ෂක තනතුරු 03 ක් පුරප්පාඩුව පැවතුනි.

(ආ) <u>සේවක ණය</u>

දීර්ඝ කාලයක සිට අය නොවී පවතින සේවක ණය ශේෂය තුල 1994 වර්ෂයේ ස්ථාන මාරුවී ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ රු.22,229 ක්, සේවය හැරගොස් ඇති නිලධාරියෙකුගේ වර්ෂ 25 කට වැඩි රු. 12,954 ක්, සේවය හැරගොස් වර්ෂ 03 කට වැඩි නිලධාරීන් 04 දෙනෙකුගේ රු. 34,760 ක් සහ විශ්‍රාමික නිලධාරියෙකුගේ වර්ෂ 2 කට වැඩි රු.15,940 ක් ඇතුලත්ව තිබුණි. මෙම පැරණි ණය ශේෂ අයකර ගැනීමට සභාව විසින් මෙතෙක් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) <u>පරිසර බලපත්‍ර</u>

පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර ස්ථාන ගණන 215ක් ලෙස හඳුනාගෙන තිබූ නමුත් 2017 වර්ෂයට පරිසර බලපත්‍ර ලබාගෙන තිබුණේ ව්‍යාපාර ස්ථාන 144 ක් පමණි. ව්‍යාපාර බලපත්‍ර ලේඛනයට අනුව පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 529 ක ප්‍රමාණයක් පැවතුණි.

(ආ) **ගොඩනැගිලි අයදුම්පත්**

2017 දෙසැම්බර් 31 දිනට දිවුලපිටිය උපකාර්යාලයට සහ කෙහෙල්ලඇල්ල උපකාර්යාලයට ලැබුණ ගොඩනැගිලි අයදුම්පත් 305 ක් අතුරින් අනුමැතිය ලබාදී තිබුනේ අයදුම්පත් 242 කට පමණි.

(ඇ) **ඉඩම් විකුණුම් මත බදු**

සභා බල ප්‍රදේශය තුල කට්ටිකර විකුණන ඉඩම් සම්බන්ධයෙන් විකිණුම් මිල මත අයවියයුතු සියයට එකක ආදායම වෙනුවෙන් අදාල විකුණුම්කරු ඉදිරිපත් කරන ලද මිල විස්තරයකට අනුව මූලික අත්තිකාරමක් අයකරගෙන තිබූ නමුත්, ඉඩම්වල සත්‍ය විකුණුම් මිල පදනම් කරගෙන නියමිත බදු මුදල අයකරගෙන නොතිබුණි.

(ඈ) **මහජන පැමිණිලි**

(i) 2017 වර්ෂය තුලදී සභාව වෙත ලැබුණු මහජන පැමිණිලි 105 කින් පැමිණිලි 50 ක් හා 2016 වර්ෂයේදී ලැබුණු මහජන පැමිණිලි වලින් පැමිණිලි 31 ක් මෙතෙක් විසඳා නොතිබුණි.

(ii) දිවුලපිටිය සතිපොළේ අංක 03 ගොඩනැගිල්ලේ දකුණුපස වෙළඳ ස්ථාන කුලියට දී නොතිබූ අතර පාරිභෝගිකයින්ට පහසුවෙන් එම ගොඩනැගිල්ලට ප්‍රවේශ වීමට හැකිවන පරිදි ගොඩනැගිල්ල ඉදි නොකිරීම සහ එම සීමාවේ පිහිටි වැසිකිළිය නිතර උතුරා යාම හේතුවෙන් වෙළඳුන් කඩ කුලියට ගැනීම ප්‍රතික්ෂේප කරන බව අනාවරණය විය.

3.5 **වත්කම් කළමනාකරණය**

3.5.1 **නිෂ්ක්‍රිය වත්කම්**

ප්‍රාදේශීය සභාව සතු අත් ට්‍රැක්ටරයක් 2002 වර්ෂයේ සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවති අතර 2018 ජූනි 19 දින වන විටත් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.5.2 **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

2017 වර්ෂයේ පුස්තකාල පොත් සමීක්ෂණයට අනුව අස්ථානගත වූ වටිනාකම සඳහන් නොවූ පොත් 216 ක් සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.6 **ප්‍රසම්පාදනය**

**කොන්ත්‍රාත් පරිපාලනය**

ඍජු කොන්ත්‍රාත් පැවරීමේ ක්‍රමය යටතේ ප්‍රජා පාදක සංවිධාන වෙත කොන්ත්‍රාත් පැවරීමේදී 2012 ජනවාරි 05 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

4. **පද්ධති හා පාලනය**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | (i) | කඩකුලී තක්සේරු නොකිරීම |
| | | (ii) | හිඟ ආදායම් එකතු නොකිරීම |
| | | (iii) | වරිපනම් බදු සංශෝධනය නොකිරීම |

| | | | |
|---|---|---|---|
| (ආ) | අයවැය පාලනය | (i) | අයවැය ප්‍රායෝගික නොවීම |
| | | (iii) | අයවැයගත තත්‍ය ආදායම් හා වියදම් අතර විචලනයන් පැවතීම. |
| (ඇ) | වත්කම් කළමනාකරණය | (i) | ඉන්වෙන්ට්‍රි ලේඛන විධිමත්ව පවත්වා නොතිබීම |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | (i) | කසළ බදු අය නොකිරීම |
| | | (ii) | කසළ බැහැර කිරීම සඳහා සුදුසු භූමියක් නොමැතිවීම. |